# පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරය




## බුදුරජාණන් වහන්සේ පිළිබඳ නොසෙල්වෙන පැහැදීමක් ඇති කර ගනිමු.

***(පසුගිය කලාපය හා සම්බන්ධයි)- සංයුත්ත නිකායේ පස්වන කොටසේ අභිසන්ද සූත්‍රය ඇසුරිනි.***

පසුගිය "සදහම් හඬ" කලාපයේ සඳහන් කළ පරිදි ආර්ය ශ්‍රාවකයෙක් බවට පත්වීමේ පළමු පියවර බුදුන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන පැහැදීමක් ඇති කරගැනීමයි.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩවසන සමයක "ඉධ භික්ඛවේ අරියසාවකෝ බුද්ධේ අවෙච්චප්පසාදේන සමන්නාගතෝ හෝති"- "මහණෙනි ආර්ය ශ්‍රාවකයා බුදුරජාණන් වහන්සේ කෙරෙහි ස්ථිරවූ පැහැදීමකින් සමන්විතයි" යනුවෙන් දේශනා කළ සේක. අවෙච්චප්පසාද කියලා කියන්නේ නොසෙල්වන, ස්ථිරවූ පැහැදීමකින් යුක්ත වීමටයි.

බුදුරජාණන් වහන්සේ ස්ථිරව පැහැදුණු පුද්ගලයා විස්තර කිරීමට යොදාගත් උපමාව ඉන්ද්‍රඛීලයයි. ඉන්ද්‍රඛීලය කියන්නේ පොළොවේ සිට අඩි 10ක්-15ක් ගැඹුරට හාරලා, ඒ වගේම පොළොවෙන් උඩටත් අඩි 10ක්-15ක් තියෙන ලොකු ගල් කණුවකට. රතන සූත්‍රයේ "යථින්ද්‍රඛීලෝ පඨවිං සිතෝ සියා" - පොළොවේ ගැඹුරට හාරලා ඉන්ද්‍රඛීලයක් හිටෙව්වද, "චතුබ්භි වාතේභි අසම්පකම්පියෝ"- හතර දිශාවෙන්ම සුළඟ හැමුවත් එය (ඉන්ද්‍රඛීලය) සොලවන්න බැහැ යනුවෙන් තෙරුවන පිළිබඳ නොසෙල්වෙන පැහැදීමක් ඇතිකර ගැනීම පිළිබඳ දේශනා කළ සේක. එලෙසින් ස්ථිරවූ පැහැදීමක් බුදුරජාණන් වහන්සේ පිළිබඳ සැබෑ ශ්‍රාවකයා තුළ පැවතිය යුතුමයි. එම පැහැදීම පරඬැල මෙන් වෙනස් වන පැහැදීමක් නොවිය යුතුයි. පරඬැල කියන්නේ සුළඟේ පාවෙලා යන දෙයක්. පරඬැල හැමතිස්සෙම සුළං හමන දිශාවට ගසාගෙන යනවා.

එලෙස පරඬැලක් නොවී, ඉන්ද්‍රඛීලයක් මෙන් නොසෙල්වෙන පැහැදීමක් ඇතිකර ගත්විට එය පුණ්‍ය ගංගාවක් (පුඤ්ඤාභිසන්ද), කුසල ගංගාවක් (කුසලාභිසන්ද), සැපය ඇති කරන්නක් බව (සුඛස්සාහාරා) අභිසන්ද සූත්‍රයේ සඳහන්වේ. අප මහා තථාගතයන් වහන්සේ පිළිබඳ නොසෙල්වෙන වූ පැහැදීමක් ඇතිකර ගැනීම සඳහා බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ පිළිබඳ සිත පහදවාගැනීම ඉතා වැදගත්වේ.

**(ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං නම් වන සේක. මීළඟ කලාපය හා සම්බන්ධයි.)**

# පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරය

## පිරිසිදු සිත යහපතම සලසයි.

***(පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේ විහාරාධිපති, ඔස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක***

***පූජ්‍ය ගරු බේරුවල සිරි සෝභිත නාහිමිපාණන් වහන්සේ විසිනි.)***

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන දිනෙක මහණෙනි’යි භික්ෂූන් වහන්සේලා ඇමතූහ.

පිරිසිදු-නැවුම් සුදු රෙදි කඩක් ඕනෑම පාට ගැන්වීමක් කළ හැකියි. එහෙත් අපිරිසිදු, කිලිටි සුදු රෙදි කඩක් පාට ගැන්වීම සාර්ථක නොවේ.

එසේම අප සිතද අපිරිසිදු නම්, කෙළෙස් වලින් පිරී ඇත්නම් මානසික හා කායික රෝගී බව ඇතිකරමින් අයහපතම සලසයි.

(1) දැඩි ලෝභය (2) ව්‍යාපාදය හෙවත් අනුන් නැසේවායි පැතීම (3) ක්‍රෝධය (4) බද්ධ වෛරය (5) ගුණමකු බව (6) පලාසය හෙවත් එකට එක කිරීම (7) ඊර්ෂ්‍යාව (8) මසුරුබව (9) මායාව (10) කපටිබව (11) ථම්භ හෙවත් දරදඬුබව (12) මානය (13) අතිමානය (14) මදය (15) ප්‍රමාදය

මේ කරුණු සිත කෙළෙසන-දූෂණය කරන කෙළෙස් ධර්මයෝය.

එබැවින් ඔබ සිතද පිරිසිදු රෙදි කඩක් සේ පිරිසිදුව තබාගන්න. එවිට පිරිසිදු-යහපත් දෙය ඔබ සිතට ඇතුල්කර ගැනීමට පහසුවේ. දෙලොව දියුණුවට එය හේතුවේ.

(ත්‍රිපිටක ධර්මයේ මජ්කඩිම නිකායේ වත්ථූපම සූත්‍රය ඇසුරිනි.)

**Ven Wimalagnana's (Abbot, Thanjan Tenne Forest Monastery, Balangoda) forthcoming Program:**

**Dec 13 Saturday & 14 Sunday: Full day special Sil programs at SL Buddhist Temple, Kenwick**

**Dec 15/16: Port Headland**

**Dec 16/17: Kalgoorlie**

**Dec 18/19: Mandurah/Bunbury**

**Dec 19-28: 9 day meditation retreat at Jhana Grove, Serpentine**

**ALL ARE WELCOME, EXPERIENCE THE PEACE**

**Inquiries: Ramani Gunasekera - ramanig@iinet.net.au**

**Visit our website of**

SRI LANKA BUDDHIST VIHARA
PERTH WESTERN AUSTRALIA

**www.srilankanvihara.org.au**

***Please send your suggestions, views and feedback through this website.***

# පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරය

- **<u>මාසික සීල වැඩසටහන:</u>** නොවැම්බර් 06 දිනට යෙදී ඇති ඉල් පුර පසළොස්වක පොහොය නිමිත්තෙන් පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරස්ථානයේ පවත්වන සීලමය වැඩසටහන නොවැම්බර් 08වන සෙනසුරාදා උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා පැවැත්වේ.

**ඉල් පුන් පොහොය බෞද්ධ අපට වැදගත් වන්නේ ඇයි?**



සම්බුද්ධ ශාසනයේ වැදගත් සිදුවීම් රැසක් මෙම පුර පොහොය දිනයේදී සිදුවූ බව ශාසන ඉතිහාසයේ සඳහන්වේ. ඒ අතර කඨින චීවර පූජාව සිදුකළ හැකි වසරේ අවසන් දිනය වීම, රහතන් වහන්සේලා 60නමක්වූ ප්‍රථම ධර්ම දූත පිරිස ධර්ම දූත සේවය සඳහා පිටත් කිරීම, තුන් බෑ ජටිලයන්ට ආදිත්ත පරියාය සූත්‍රය දේශනා කිරීම, මෛත්‍රී බෝධිසත්වයන් මතු බුදුවීම සඳහා ගෞතම බුදුන් වහන්සේගෙන් නියත විවරණ ලැබීම, ධර්ම සේනාධිපති වූ සැරියුත් මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑම, බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව ථූපාරාම චෛත්‍යයෙහි නිදන් කිරීම යන සිදුවීම් ප්‍රධාන වේ.

- **<u>සූත්‍ර දේශනා සහ සත්පතා භාවනා වැඩ සටහන:</u>**

**බදාදා සහ සෙනසුරාදා දිනවල රාත්‍රී 7.15 සිට 8.30 දක්වා පැවැත්වෙන විශේෂ වැඩසටහන් සඳහා ඔබ සැමට ආරාධනා!**

සැම මසකම පළමු බදාදා- පූජ්‍ය බේරුවල සිරි සෝභිත නාහිමියන් විසින් පවත්වන සූත්‍ර දේශනා

දෙවන සහ හතරවැනි බදාදා- සිරි සෝභිත නාහිමියන්ගේ මඟපෙන්වීම යටතේ වන භාවනා වැඩසටහන්

තුන්වන බදාදා සහ සෙනසුරාදාවන්හි- උපදෙස් රහිත භාවනා වැඩසටහන් (පුහුණු අය සඳහා- Experienced Meditators)

ඒ සඳහා වන වැඩිදුර තොරතුරු slsbsmeditation@gmail.com වෙත ලිවීමෙන් විද්‍යුත් තැපෑලෙන් ලබා ගත හැක.

- **<u>විහාරස්ථානයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන අරමුදල් සම්පාදනය</u>**

පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේ අභිනවයෙන් ඉදිකිරීමට බලාපොරොත්තුවන නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන අරමුදල් සම්පාදනය මේ වන විට සිදු කෙරෙමින් පවතී. ඒ සඳහා වන මුදල් පොරොන්දු (pledges) $1,000 බැගින් වන අතර ඔබත් මේ සත් ක්‍රියාවට දායකවීමට කැමති නම් ඒ සඳහා ඔබගේ විස්තර විහාරස්ථානයේ දැන්වීම් පුවරුවේ වන දැන්වීමට ඇතුලත් කිරීම හෝ slsbstreasurer@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ බෞද්ධ සංගමයේ භාණ්ඩාගාරිකට දැනුම් දිය හැක.

- ***<u>බෞද්ධ සංගමයේ සාමාජිකත්ව මුදල් ගෙවීම</u>***

විහාරස්ථානයේ නඩත්තු කටයුතු සඳහා මාසිකව $5,000 ඉක්මවා වැයවේ. ඒ සඳහා වන අරමුදල් රැස්කර ගත හැකි ප්‍රධාන මාර්ගය මසකට $20 වන ඔබගේ සාමාජික මුදලයි. එම මුදල් වසර සඳහා හෝ මාසිකව $20 බැගින් හෝ පහත ගිණුමට සෘජුව බැර කළ හැක. එසේ බැර කිරීමේදී ඔබගේ නම පැහැදිලිව සඳහන් කරන්න. අදාල මුදල් ලදුපත් (Receipts) මුදල් ලැබීමෙන් පසු නිකුත් කෙරේ.

**Account Name:** Sri Lankan Sinhalese Buddhist Society **Bank:** ANZ
**BSB:** 016002 **A/C No.** 498831089

# පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරය

## කඨින චීවර පූජා මහෝත්සවයේ විශේෂ අවස්ථා

2014 ඔක්තෝම්බර් 11 දින පර්ත් ශ්‍රී ලංකා බෞද්ධ විහාරයේදී දහම් පාසලේ අනුග්‍රාහකත්වයෙන් මෙවර කඨින පිංකම සංවිධානය කෙරිණි. ඒ සඳහා දහසකට ආසන්න සැදැහැති පිරිසක් සහභාගි වූහ.









## 2014 ඔක්තෝම්බර් 26 දින විහාරස්ථානයේ පැවැත්වූ මහා ආහාර සල්පිල

මෙම ආහාර සල්පිලෙන් $14,073.33 ක ශුද්ධ ආදායමක් උපයා ගත හැකිවිය. ඒ සඳහා සහායවුණු ඔබ සැමට තුති!


























### ශ්‍රී ලංකා සිංහල බෞද්ධ සංගමය

**ගරු අනුශාසකත්වය**

පූජ්‍ය බේරුවල සිරි සෝභිත නාහිමි

පූජ්‍ය පල්ලෙවෙල විසුද්ධවංශ හිමි

**2014/2015 කමිටුව**

**සභාපති:**

ශෝභා සේනසිංහ

slsbspresident@gmail.com

**ලේකම්:**

දිල්හානි ද සිල්වා

slsbssecretary@gmail.com

**භාණ්ඩාගාරික:**

අචලා පුංචිහේවා

slsbstreasurer@gmail.com

**උප සභාපති:**

වසන්තා විජේවර්ධන

**උප සභාපති, අධ්‍යාපන:**

නන්දිකා මිරිහාන

**සංස්කාරක**

සේනක වැලිදෙණිය

**අනෙකුත් කමිටු සාමාජිකයන්**

උපාලි ගුණසේකර

රජීව් ගුණවර්ධන

මහින්ද කුරුප්පු

ප්‍රේමලාල් මෙන්ඩිස්

සේනක ද සිල්වා

සුනිල් සමරවීර

ගුණදාස පෙරේරා

දිනේෂ් ද සිල්වා

ලලන්ත සෙනෙවිරත්න

අනෝජා චන්ද්‍රතිලක

ජයන්ති ගමගේ